13521

AL/2010/52-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**52 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2010**

**නර්තනය - සිංහල I**
நடனம் - சிங்களம் I
**Dancing - Sinhala I**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ..................................

- ※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත වේ.
- ※ I වන කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, II කොටසේ ප්‍රශ්න **හතරකට** ද පිළිතුරු සපයන්න.
- ※ I වන කොටසේ කෙටි ප්‍රශ්න 20ක් ඇතුළත් වේ. **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- ※ I වන කොටසේ පිළිතුරු, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **අමුණා** භාර දෙන්න.

## I කොටස

1. • අංක **1.1** සිට **1.5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු **හිස්තැන්වල** ලියන්න.

1.1 අයිලය යනු ............................................................ ආභරණ තැන්පත් කරන ස්ථානයකි.

1.2 පණ්ඩුකාභය රජ තෙමේ චිත්‍රරාජයා සමඟ සම අස්නෙහි හිඳගෙන දෙව් මිනිස් නැටුම් කර වූ බව .............................. 10 වන පරිච්ඡේදයේ දැක්වේ.

1.3 මඩුපුරය, කෝල්පාඩුව, දුනුමාලප්පුව යන නර්තන අංග දැකිය හැකිවන්නේ .............................................................. ශාන්තිකර්මයේ දී ය.

1.4 මාතර, බෙන්තර හා ............................................................ වශයෙන් ප්‍රාදේශීය නර්තන ශෛලීන් තුනක් පහතරට නර්තන සම්ප්‍රදායේ දැකිය හැකි ය.

1.5 නාග ගජගා, අනිලා සහ කදම්භපක්ෂී යන වන්නම් ඇතුළත් වන්නේ .............................................. නර්තන සම්ප්‍රදායට ය.

• අංක **1.6** සිට **1.10** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු අදාළ **තිත් ඉරිමත** ලියන්න.

1.6 පහත දැක්වෙන නර්තන අංග අයත් වන්නේ කුමන සම්ප්‍රදායයන් වලට ද?

(1) ශුද්ධ මාත්‍රය -.................................... (2) මුල් මාත්‍රය -..............................................

1.7 පොළොන්නරු යුගයේ නර්තනය සඳහා ඉදි වූ බැව් කියැවෙන මණ්ඩපයේ නම කුමක් ද? එය ඉදිකළේ කුමන රජු විසින් ද?

(1) ............................................. (2) .............................................

1.8 ගඩලාදෙණිය විහාරය සහ ඇම්බැක්කේ දේවාලය වඩාත් ප්‍රචලිතව ඇත්තේ කුමන රූකම් සඳහා ද?

(1) ............................................. (2) .............................................

1.9 බලි ශාන්තිකර්මයේ දී බලි ඇඹීමට ගන්නා ප්‍රධානතම ද්‍රව්‍ය හා නර්තනයේ දී තාල තැබීමට ගන්නා රංග භාණ්ඩය නම් කරන්න.

(1) ............................................. (2) .............................................

1.10 ශාන්තිකර්ම ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණාත්මකව ලියැවුණු පහත සඳහන් ග්‍රන්ථ **දෙකෙහි** කතෘවරුන් නම් කරන්න.

(1) ශාන්තිකර්ම හා සිංහල සමාජය .............................................

(2) කොහොඹා යක් කංකාරිය සහ සමාජය .............................................

[ දෙවෙනි පිටුව බලන්න.

agaram.lk

- අංක **1.11** සිට **1.20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩා නිවැරදි හෝ ඉතාම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** වරහන් තුළ ලියන්න.

1.11 මාත්‍රා තුනේ තනි තිතට අයත් උඩරට, පහතරට සහ සබරගමු වන්නම් ලෙස සැලකෙන්නේ
(1) උකුසා, අනුරාගදණ්ඩ තාලය හා කදම්භපක්ෂි වන්නම් ය.
(2) ගාහක, හනුමන්තා තාලය හා අනිලා වන්නම් ය.
(3) ගජගා, ශුද්ධ තාලය හා ආනන්ද වන්නම් ය.
(4) කිරළා, ලලිත රාග තාලය හා විරාඩි වන්නම් ය.
(5) වෛරොඩි, ලලිත රාග තාලය හා කදම්භපක්ෂි වන්නම් ය. (.........)

1.12 අගය වඩන කවි වරුණා - රහය දනෙයි කළ රචනා මෙම කවි පාදයේ ලඝු ගුරු සංඛ්‍යාව කිය ද?
(1) ලඝු අක්ෂර 18 ගුරු අක්ෂර 2 කි. (2) ලඝු අක්ෂර 18 ගුරු අක්ෂර 3 කි.
(3) ලඝු අක්ෂර 19 ගුරු අක්ෂර 2 කි. (4) ලඝු අක්ෂර 20 ගුරු අක්ෂර 2 කි.
(5) ලඝු අක්ෂර 22 ගුරු අක්ෂර 3 කි. (.........)

1.13 "ලකළ පුළුලුකුළැ බඳ මිණි මෙවුල්ලා - සමග රන් සළඹ රැව්දී වෙවුල්ලා"
මෙම නළඟන රැඟුම් වර්ණනාව සඳහන් සංදේශ කාව්‍යය වන්නේ
(1) සැළලිහිණි සංදේශයයි. (2) කෝකිල සංදේශයයි.
(3) හංස සංදේශයයි. (4) තිසර සංදේශයයි.
(5) මයුර සංදේශයයි. (.........)

1.14 කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු ලෙස සැලකෙන්නේ
(1) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර සහ සෙනෙරත් දෙවි වේ.
(2) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර සහ වීරමුන්ඩ දෙවි වේ.
(3) කොහොඹා දෙවි, කන්දේ බණ්ඩාර සහ දෙවොල් දෙවි වේ.
(4) කොහොඹා දෙවි, බණ්ඩාර හැටහත්කට්ටුව සහ පත්තිනි දෙවි වේ.
(5) කොහොඹා දෙවි, බණ්ඩාර දෙවි සහ සමන් දෙවි වේ. (.........)

1.15 අනුපිළිවෙළින් තෙල්මේ, දරු නැලවිල්ල සහ කෝල සන්නිය අයත් පහතරට ශාන්තිකර්ම පෙළ තෝරන්න.
(1) දෙවොල් මඩුව, සූනියම, සන්නියකුම (2) දෙවොල් මඩුව, ගරායකුම, සන්නියකුම
(3) පහන් මඩුව, මහසොහොන් සමයම, සන්නියකුම (4) දෙවොල් මඩුව, රටයකුම, සන්නියකුම
(5) පහන් මඩුව, රටයකුම, සන්නියකුම (.........)

1.16 එරන්දති වර්ණනාව සහ රන්තෙලඹුවේ කවි යොදා නිර්මාණය වී ඇති ගැමි නැටුම් දෙකක් වන්නේ,
(1) පන් නෙළීමේ නැටුම සහ මෝල්ගස් නැටුම ය. (2) පන් නෙළීමේ නැටුම සහ කළගෙඩි නැටුම ය.
(3) ගොයම් නැටුම සහ කළගෙඩි නැටුම ය. (4) ගොයම් නැටුම සහ තාලම් නැටුම ය.
(5) ගොයම් නැටුම සහ කුළු නැටුම ය. (.........)

1.17 නල දමයන්ති සහ පරෙවිය මුද්‍රා නාට්‍යයන්හි නර්තන නිර්මාණ කරන ලද්දේ
(1) චිත්‍රසේන ඩයස් සහ ප්‍රේමකුමාර එපිටවලයන් ය. (2) චිත්‍රසේන ඩයස් සහ පණිභාරතයන් ය.
(3) ශේෂා පලිහක්කාර සහ වසන්ත කුමාරයන් ය. (4) ශේෂා පලිහක්කාර සහ ශාන්ත කුමාරයන් ය.
(5) වසන්ත කුමාර සහ ශාන්ත කුමාරයන් ය. (.........)

1.18 ශාන්තිකර්මවල වෙස් මුහුණු පළඳ කරනු ලබන රංගනයේ අරමුණ වී ඇත්තේ
(1) එක් එක් චරිතවල විවිධත්වය වර්ණ මගින් පෙන්වා දීම සඳහා ය.
(2) ප්‍රේක්ෂකයන්ට විවිධ වූ රස ජනිත කරවීම සඳහා ය.
(3) රංගනය කරනු ලබන චරිත ලක්ෂණය ඉස්මතු කිරීම සඳහා ය.
(4) ප්‍රේක්ෂකාගාරය ප්‍රීති ප්‍රමෝදයට පත්කිරීම සඳහා ය.
(5) ශාන්තිකර්මයේ හාස්‍යය, භයානක සහ ශෝක රස හඳුනාගැනීම සඳහා ය. (.........)

1.19 කස්තිරම/ඉරට්ටිය/කලාසම යන්නට අර්ථ දක්විය හැක්කේ
(1) ශාස්ත්‍රීය නර්තනයක් අවසානයේ තාල රූපයට උචිතව ඉදිරිපත් කෙරෙන අවසාන කොටස වශයෙනි.
(2) ඕනෑම නර්තනයක් අවසානයේ තාල රූපයට වෙනස් වූ වේගවත් නර්තන කොටසක් වශයෙනි.
(3) නර්තනයක් හෝ පද කොටසක් අවසන් කිරීමේදී එය බණ්ධනය සඳහා සුවිශේෂ සංකීර්ණ පද කොටසක් වශයෙනි.
(4) දීර්ඝතම නර්තනයකට ඇතුළත් විය යුතු අනිවාර්ය වූ පද කොටසක් වශයෙනි.
(5) ක්‍රම ක්‍රමයෙන් වේගවත්ව නර්තනය කරනු ලබන විවිධ හැඩතල යොදමින්, තාලයකට පටහැනිව ඉදිරිපත් කෙරෙන, පද කොටසක් වශයෙනි. (.........)

1.20 කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව තිබූ සෞන්දර්ය අධ්‍යයන ආයතනය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් වූයේ කුමන වර්ෂයේ දී ද?
(1) වර්ෂ 1995 දී ය. (2) වර්ෂ 2003 දී ය.
(3) වර්ෂ 2004 දී ය. (4) වර්ෂ 2005 දී ය.
(5) වර්ෂ 2006 දී ය. (.........)

* *



මෙතැනින් කපන්න

agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**52 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

නර්තනය - සිංහල I
நடனம் - சிங்களம் I
Dancing - Sinhala I

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

2. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   (i) කෝලම් හෝ සොකරි ජන නාටකයේ චරිත නිරූපණය
   (ii) කරදිය මුද්‍රා නාට්‍යය
   (iii) වන්නම් හා සිංදු වන්නම්වල ඓතිහාසික තොරතුරු
   (iv) සතර අභිනය
   (v) ගැමි නැටුම්වල ආගමික පසුබිම

3. නර්තන කලා ඉතිහාසය දෙස බලන විට එහි ප්‍රවර්ධනයට රාජ්‍ය පාලකයන්ගෙන් ලත් දායකත්වය ඓතිහාසික තොරතුරු මගින් හෙළිවේ.
   (i) අනුරාධපුර යුගය ඇසුරෙන් සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.
   (ii) පොළොන්නරු යුගය ඇසුරෙන් ඉහත කියමන පරීක්ෂා කරන්න.
   (iii) කොහොඹා කංකාරිය පිළිබඳ තොරතුරු ඉහත කියමන ඇසුරෙන් සාකච්ඡා කරන්න.

4. (i) කවර හෝ සම්ප්‍රදායක, ගායනය ප්‍රධානකොට ගැනෙන ශාස්ත්‍රීය නර්තනයක මාත්‍රා 4 අයත් කවියක් ප්‍රස්තාර කරන්න.
   (ii) තුඳ කුජිගත වට්ටමේ පදය සහ කස්තිරම
   හෝ
   ගුඳගති ගති වට්ටමේ පදය සහ සුරල
   හෝ
   යාදිනි මාත්‍රයේ පදය සහ කලාසම ප්‍රස්තාර කරන්න.
   (iii) මාත්‍රා 3 + 4 තාල රූපයට අයත් වන්නමක/සින්දු වන්නමක අඩව්වක් හෝ ඉරට්ටිය ප්‍රස්තාර කරන්න.

5. කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ අන්තර්ගත ශාස්ත්‍රීය නර්තන, වාදන පමණක් නොව රංග වස්ත්‍රාභරණවලට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි.
   (i) කුවේණි අස්න හා යක් ඇනුම නර්තනවල දැකිය හැකි වෙනස්කම් මොනවාද'යි පෙන්වා දෙන්න.
   (ii) මඟුල් බෙර, අත්‍යාබෙර යන වාදන අවස්ථාවන් හා එහි ඇති ශාස්ත්‍රීය වටිනාකම විග්‍රහ කරන්න.
   (iii) රංග වස්ත්‍රාභරණවල සුවිශේෂතා හා වර්ණ භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.

6. දේශීය අවනද්ධ භාණ්ඩ සන්නිවේදන කාර්යයට පමණක් නොව දේශීය සංගීතයට ද මනා පිටිවහලක් වේ.
   (i) අතීතයේ සන්නිවේදන කාර්ය සඳහා අවනද්ධ වාද්‍ය භාණ්ඩ යොදගත් ආකාරය විමසන්න.
   (ii) දේශීය අවනද්ධ භාණ්ඩ නූතන සංගීත නිර්මාණ කාර්යයට යොදා ගැනීම පිළිබඳ විග්‍රහයක් කරන්න.

7. පහන් මඩුව, දෙවොල් මඩුව යන ශාන්තිකර්මයන්හි කතා පුවත් හා පූජා පෙළපාළි විධිවල සමානතා මෙන්ම අසමානතා ද දක්නට ලැබේ.
   (i) පුරාවෘත්ත කතාව ඇසුරෙන් ඉහත නියමන විමසන්න.
   (ii) පූජා විධි රටාවේ ඇති සහසම්බන්ධය පෙන්වා දෙන්න.
   (iii) නාට්‍යමය අවස්ථා දෙකක් ගෙන ඉහත පාඨය පරීක්ෂා කරන්න.

8. "පහතරට නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මවල වෙස් මෝස්තර නිර්මාණය පොහොසත් බවක් පෙන්නුම් කරයි."
   (i) ශාන්තිකර්මවල රූපණ අවස්ථා **දෙකක්** ගෙන විමසන්න.
   (ii) වෙස් මුහුණු හා රංග වස්ත්‍රවල විචිත්‍රත්වයට බලපෑ හේතු පෙන්වා දෙන්න.

9. දේශීය නර්තනයේ සාම්ප්‍රදායික බව, නූතන මාධ්‍ය මගින් පසුබෑමට ලක් කොට ඇත. එම රංග කලාවන් සුරැකීමටත් ඊට නිසි තැන ලබාදීමටත් ඔබගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කරන්න.

* * *

agaram.lk

13521

AL/2010/52-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

52 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

නර්තනය - සිංහල II
நடனம் - சிங்களம் II
Dancing - Sinhala II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය: ..................................

- ※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත වේ.
- ※ I වන කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද, II කොටසේ ප්‍රශ්න **හතරකට** ද පිළිතුරු සපයන්න.
- ※ I වන කොටසේ කෙටි ප්‍රශ්න 20ක් ඇතුළත් වේ. **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය.
- ※ I වන කොටසේ පිළිතුරු, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **අමුණා** භාර දෙන්න.

## I කොටස

1. ● අංක 1.1 සිට 1.5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු **හිස්තැන්වල** ලියන්න.

1.1 භරත නාට්‍යම් සම්ප්‍රදායයෙහි ප්‍රධානතම අවනද්ධ භාණ්ඩය ............................................ ලෙස සැලකේ.

1.2 සිරුරේ උපාංග කොටස් මගින් කෙරෙන අදහස් ප්‍රකාශනය ............................................ අභිනය යනුවෙන් හැඳින්වේ.

1.3 බටහිර බැලේ නර්තනයට යොදා ගැනෙන සංචලන අයත් වන්නේ හුදු ......................................... චලනවලට ය.

1.4 හුදී ජනයාගේ සංතුෂ්ටිය පිණිස පස්වෙනි වේදය වශයෙන් ........................................ ඇති කළ බව භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් වේ.

1.5 රෞද්‍ර රසය උපදින්නේ ........................................ නමැති ස්ථායි භාවය තුළිනි.

● අංක 1.6 සිට 1.10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු අදාළ **තිත් ඉරිමත** ලියන්න.

1.6 කෝලාට්ටම් සහ වෙම්බු යන භාරතීය ගැමි නැටුම්වලට සමාන දේශීය ගැමි නැටුම් දෙකක් නම් කරන්න.

(1) ............................................ (2) ............................................

1.7 වේදිකා ආලෝකයේ දී මූලික වශයෙන් භාවිත වන පහන් වර්ග ලෙස හැඳින් වේ.

(1) ............................................ (2) ............................................

1.8 පහත නම් සඳහන් නර්තන ශිල්පියා සහ ශිල්පිණිය ප්‍රවීණයන් ලෙස සැලකෙන්නේ කුමන නර්තන සම්ප්‍රදායන් වලට ද?

(1) ශ්‍රීමතී රුක්මණී දේවි අරුන්ඩේල් ............................................

(2) ශ්‍රී බ්‍රින්දදීන් මහ රාජ් ............................................

1.9 රෝයල් ඩීලා ඩාන්ස් ඇකඩමිය නම් වූ ප්‍රථම වෘත්තීය නර්තන ආයතනය බිහි වූ රට සහ එහි නිර්මාතෘ කවුරුන් ද?

(1) ............................................ (2) ............................................

1.10 භාරතයේ කේරළ කලා මණ්ඩලම් සහ ශාන්ති නිකේතනයේ නිර්මාතෘවරුන් **දෙදෙනා** නම් කරන්න.

(1) ............................................ (2) ............................................

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **1.11** සිට **1.20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩා නිවැරදි හෝ ඉතාම ගැළපෙන පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** වරහන් තුළ ලියන්න.

1.11 කථක් නර්තන සම්ප්‍රදායට යොදාගන්නා සංගීතය සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩ ඇති වරණය තෝරන්න.
(1) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය - මෘදංගය හා මද්දලය
(2) දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය - මෘදංගය හා තබ්ලාව
(3) උත්තර භාරතීය බෙංගෝලි සංගීතය - සරෝද් හා තබ්ලාව
(4) උත්තර භාරතීය හින්දුස්ථානී සංගීතය - පඛාවජ් හා තබ්ලාව
(5) උත්තර භාරතීය හින්දුස්ථානී සංගීතය - හාමෝනියම් හා තබ්ලාව (………)

1.12 උත්සාහය, ජුගුප්සා, විශ්මය යන ස්ථායි භාවයන් තුළින් උපදින්නේ කවර රසයන් ද?
(1) ශෘංගාර, අද්භූත හා භයානක
(2) ශෘංගාර, හාස්‍ය හා භයානක
(3) ශාන්ත, රෞද්‍ර හා භයානක
(4) වීර, බීභත්ස්‍ය හා රෞද්‍ර
(5) වීර, බීභත්ස්‍ය හා අද්භූත (………)

1.13 කථකලි නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ කතා පුවත් ගොඩ නැගී ඇත්තේ පහත සඳහන් කවර ග්‍රන්ථවල ද?
(1) රාමායනය, ශාකුන්තලය හා ශිලප්පදිකාරම්
(2) රාමායනය, මහා භාරතය හා භගවත්ගීතාව
(3) අභිනය දර්පනය, මහාභාරතය හා භගවත්ගීතාව
(4) නාට්‍ය ශාස්ත්‍රය, මේඝ දූතය හා ගීත ගෝවින්දය
(5) පංච තන්ත්‍රය, මේඝ දූතය හා ගීත ගෝවින්දය (………)

1.14 පහත සඳහන් භාණ්ඩ අතුරෙන් මනිපුරි නර්තනයට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ මොනවා ද?
(1) පුංග්, කෝල් හා පෙනකොම්බාව
(2) පඛාවජ්, කෝල් හා පෙනකොම්බාව
(3) තබ්ලා, කෝල් හා සාරංගී
(4) ඩොල්කි, තබ්ලා හා සාරාංගී
(5) ඩොල්කි, එස්රාජ් හා දිල්රුබාව (………)

1.15 19 වන සියවස අගභාගයේ දී පීටර් චෙයිකොව්ස්කි විසින් සංගීතවත් කළ බැලේ නාට්‍ය තුනක් වන්නේ,
(1) හංසවිල, රෝමියෝ ජුලියට් හා ගිසෙල්ලි ය.
(2) හංසවිල, නට් ක්‍රැකර් හා ගිසෙල්ලි ය.
(3) හංසවිල, නට් ක්‍රැකර් හා නිදිකුමාරි ය.
(4) හංසවිල, පෙට්රුෂ්කා හා ලා ජිප්සි ය.
(5) හංසවිල, පෙට්රුෂ්කා හා කොපෙලියා ය. (………)

1.16 පෙරදිග නෘත්‍ය හා අපරදිග බැලේ අතර පවතින වෙනස්කම් වන්නේ
(1) සතර අභිනය භාවිතයේ ඇති වෙනස්කම් ය.
(2) ගායනය, සංගීතය හා නර්තනය අතර පවතින වෙනස්කම් ය.
(3) ආගමික හා සමාජීය කතා පුවත් යොදා ඉදිරිපත් කරන වෙනස්කම් ය.
(4) නර්තනය, සංගීතය, වේදිකාව හා ශිල්පීය ක්‍රම අතර ඇති වෙනස්කම් ය.
(5) නෘත්ත, නෘත්‍ය, නාට්‍ය අතර දක්නට ඇති වෙනස්කම් ය. (………)

1.17 නර්තන කලාවේ ආහාර්ය අභිනය ලෙස සැලකිය හැක්කේ
(1) වේදිකා සැරසිලි, විදුලිය, තිර හා තළුතිලි වේ.
(2) වේදිකා සැරසිලි, ආලෝකය, සංගීතය හා වාදන උපකරණ වේ.
(3) වේදිකා සැරසිලි, ආලෝකය, සංගීතය හා රංගවින්‍යාසය වේ.
(4) වේදිකා සැරසිලි, ආලෝකය, රංග වස්ත්‍රාභරණ හා රංග රචනය වේ.
(5) වේදිකා සැරසිලි, ආලෝකය, රංග වස්ත්‍රාභරණ හා අංග රචනය වේ. (………)

1.18 කොක්තුම්බි, කුමීන් හා පොෂ්වාන් යනු
(1) මනිපුරි නර්තන සම්ප්‍රදායේ හිස්පළඳනා වේ.
(2) මනිපුරි නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ වේ.
(3) කථක් නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ වේ.
(4) කථක් නර්තන සම්ප්‍රදායේ ආභරණ වේ.
(5) කථකලි නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ වේ. (………)

1.19 නිජින්ස්කි වස්ලව් සහ මයිකල් ෆෝකයින් යන බැලේ නර්තන ශිල්පීන් උපත ලැබුවේ
(1) ප්‍රංශයේදී ය.
(2) එංගලන්තයේදී ය.
(3) ඉතාලියේදී ය.
(4) රුසියාවේදී ය.
(5) ඩෙන්මාර්කයේදී ය. (………)

1.20 ලෝක නර්තන දිනය ලෙස අප්‍රේල් 29 වන දින නම් කර ඇත්තේ
(1) ප්‍රංශ ජාතික කැතරින් ඩී මෙඩිසිගේ උපන් දිනය වෙනුවෙනි.
(2) ප්‍රංශ ජාතික ජෝන් ජෝර්ජ් නෝවේර් ගේ උපන් දිනය වෙනුවෙනි.
(3) ප්‍රංශ ජාතික 14 වන ලුවී රජතුමාගේ උපන් දිනය වෙනුවෙනි.
(4) රුසියානු ජාතික නිජින්ස්කි වස්ලව්ගේ උපන් දිනය වෙනුවෙනි.
(5) රුසියානු ජාතික ඇනා-පාව්ලෝවාගේ උපන් දිනය වෙනුවෙනි. (………)

**

agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**52 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

නර්තනය - සිංහල II
நடனம் - சிங்களம் II
Dancing - Sinhala II

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

**2.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i) නව නළු රස
(ii) රංග භූමිය හා එහි විශේෂතා
(iii) මුද්‍රා භාවිතය
(iv) කථකලි සම්ප්‍රදයේ මූලික අභ්‍යාස
(v) අවකාශ භාවිතය හා රංග වින්‍යාසය

**3.** (i) මනිපුරි නර්තන සම්ප්‍රදය බිහිවීම හා සම්බන්ධ සාධක **දෙකක්** ඉදිරිපත් කරන්න.
(ii) ආගමික විශ්වාස හා බැඳි මනිපුරි නර්තන අංගයක් පිළිබඳ විස්තරයක් කරන්න.
(iii) මනිපුරියේ ආගමික හා සාමාජීය වටිනාකමක් ඇති උත්සවයක් ගැන ඇගයීමක් කරන්න.

**4.** දේවදාසි නර්තන ඇසුරෙන් ආරම්භව, ක්‍රමවත්ව ව්‍යාප්ත වූ භරත නාට්‍යම් ඉපැරණි නර්තන සම්ප්‍රදයකි.
(i) ඉපැරණි නර්තනවල ක්‍රමවේදය නූතන තත්ත්වයට සකස් කළ තාංජෝවූර් සහෝදරයන් පිළිබඳ විමසීමක් කරන්න.
(ii) ප්‍රබල ලෙස දේව භක්තිය දනවන නර්තන අංගයක් ගැන සාකච්ඡා කරන්න.
(iii) රංගන ශිල්පිණියන්ගේ රංග වස්ත්‍රාභරණ භාවිතය පිරික්සන්න.

**5.** කථකලි නර්තන සම්ප්‍රදය වූ කලී කේරළ ප්‍රාන්තයේ බිහි වූ නෘත්‍ය නාටකවලට හිමිකම් කියන නර්තන කලාවකි.
(i) රාමාට්ටම් සහ ක්‍රිෂ්ණාට්ටම් නෘත්‍ය නාටක බිහිවීමට හේතු වූ සාධක ලියා දක්වන්න.
(ii) චරිත නිරූපණය සඳහා යොදා ගන්නා අංග රචනයේ විශේෂත්වය පෙන්වා දෙන්න.
(iii) සංගීත සම්ප්‍රදය නම් කර, ඊට ආවේණික වාද්‍ය භාණ්ඩවල වෙනස්කම් වෙන් කොට දක්වන්න.

**6.** කථක් නර්තන සම්ප්‍රදය පසු කලෙක රාජ අනුග්‍රහය මත ව්‍යාප්ත වී ඇත.
(i) ඉහත පාඨය ඇසුරෙන් තොරතුරු සාකච්ඡා කරන්න.
(ii) රංග වස්ත්‍රාභරණවලට එය බලපෑ ආකාරය පෙන්වා දෙන්න.
(iii) එහි ව්‍යාප්තියට ඝරානාවලින් ලැබුණු පිටිවහල හා එය වර්තමානයට කෙසේ බලපා ඇත්ද'යි විග්‍රහයක් කරන්න.

**7.** උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය නර්තන සම්ප්‍රදායන්හි අනන්‍යතා ලක්ෂණ මනාව ගම්‍ය වේ.
(i) සංගීතය සහ වාද්‍ය භාණ්ඩ ඇසුරෙන් ඉහත කරුණු සනාථ කරන්න.
(ii) පහත සඳහන් නර්තන අංග අයත් වන සම්ප්‍රදායන් නම් කොට, ඒවා නෘත්ත හා නෘත්‍ය වශයෙන් ද වෙන් කොට දක්වන්න.
1. අලාරිප්පු 2. වර්ණම් 3. ඨුම්රි 4. තිල්ලානා 5. ආමද් 6. භාවගත් 7. ශබ්දම් 4. තරානා

**8.** "විදේශීය නර්තන ආභාෂයන්ගෙන් පෝෂණය වූ නූතන ප්‍රාසාංගික නර්තන කලාව දේශීය නර්තනයට අභියෝගයක් වී තිබේ. පුවත් පතකට විචාරාත්මක ලිපියක් ලියන්න.

**9.** (i) බැලේ රංග කලාවේ ප්‍රභවය පිළිබඳ විස්තරයක් කරන්න.
(ii) එය විකාශනය වීමේදී රුසියාවෙන් ලැබුණු දායකත්වය හා සංවර්ධනය පිළිබඳ විමසුමක් කරන්න.
(iii) හංසවිල බැලේ නාට්‍ය රංගනයේදී හංස ධේනුවගේ චරිතයට පණදුන් නර්තන ශිල්පිණියන් **දෙදෙනකු** ගැන ඇගයීමක් කරන්න

***

agaram.lk